# ආණ්ඩුවේ නිවේදන

එල්ඩී.-බී. 21/78 IV.

## 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 23 (2) වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

එම්. ඒ. මුනිදාස,
වැඩබලන ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1996 සැප්තැම්බර් මස 13 දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 1996 අංක 12 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1990 ජනවාරි මස 05 දින අංක 591/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල නියමාවලිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) එහි 4 වන ඡේදයේ (ඕ) වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් :-

" (ඕ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, විශ්ව විද්‍යාලය විසින් අනුමත කරනු ලබන අධ්‍යයන අංශවල පර්යේෂණ පැවැත්වීම සඳහා අරමුදල් වෙන්කර දීම සහ වෙනත් පහසුකම් සැපයීම; "

(ආ) එහි 7 වන ඡේදයේ (I) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :-

" (1) (අ)(ආ)ඡේදයේ විධිවිධානවලට යටත්ව, විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා, ඒ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශිත නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතුය.

(ආ) කිසිම තැනැත්තකු අනුක්‍රමික දුර කාල දෙකකට වැඩි ගණනකට එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් පත් කරනු නොලැබිය යුතුය.

(ඇ) විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා, කොමිෂන් සභාව විමසීමෙන් පසු, ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය ".

(ඇ) එහි 13 වන ඡේදයේ (2) වන අනුඡේදයේ (VII) වන වගන්තියේ " ගුවන් විදුලි " යන වචන වෙනුවට " ජනමාධ්‍ය " යන වචනය ආදේශ කිරීමෙන්.

(ඈ) එහි 14 වන ඡේදයේ (2) වන අනුඡේදයේ :-

(i) " (I) වන ඡේදයෙන් " යන වචන හා ඉලක්කම් වෙනුවට " (I) වන අනුඡේදයෙන් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අනුඡේදයේ (xiv) වන හා (xv) වන වගන්තිවල " අධ්‍යාපන අංශ " යන වචන වෙනුවට " අධ්‍යයන අංශ" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) ඒ අනුඡේදයේ (xvi) සහ (xvii) වන වගන්ති වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ආදේශ කිරීමෙන් ;

" (xvi)(අ) විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනික තාක්ෂණය සැළසුම් කිරීම සහ සංවර්ධනය සඳහා, සහ විවෘත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා යෝග්‍ය ඉගැන්වීමේ උපකාරක ද්‍රව්‍ය සම්පාදනය කිරීම සඳහා බලතල, කාර්ය, සහ කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයක් පත් කිරීම ;

(ආ) අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලය මෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) උපකුලපතිවරයා ;
(ii) අධ්‍යාපනික තාක්ෂණ අධ්‍යක්ෂවරයා ;
(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;
(iv) අධ්‍යක්ෂ, ප්‍රාදේශීය අධ්‍යාපන සේවය ;
(v) පුස්තකාලයාධිපති ;
(vi) අධ්‍යාපන අධ්‍යයන අංශයේ ප්‍රධානියා ;
(vii) අධ්‍යාපනික තාක්ෂණ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ සහ ඊට ඉහළ ශ්‍රේණිවලට අයත් සෑම ආචාර්යවරයෙක්ම ;
(viii) සනාතන සභාව විසින් සිය සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගන්නා එක් සාමාජිකයෙක්.
(ix) එක් එක් පීඨ මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත්කර ගන්නා එක් සාමාජිකයෙක්.

(ඇ) අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයේ ලේකම්වරයා, උපකුලපතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

(ඈ) (ආ) අතුරු වගන්තියේ (ix) අතුරු අනුවගන්තිය යටතේ තෝරාපත් කර ගන්නා සාමාජිකයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියකට අයත් විය යුතු අතර ඔහු තෝරා පත්කර ගන්නා ලද දිනයේ සිට අවුරුදු දෙකක් ධුරය දැරිය යුතුය.

(xvii)(අ) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා සැළසුම් කිරීම හා සංවර්ධනය කිරීම සහ ඉගෙනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සම්පත් සැපයීම සඳහා, බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලයක් පත් කළ යුතුය.

(ආ) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) උපකුලපතිවරයා ;
(ii) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අධ්‍යක්ෂවරයා ;
(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;
(iv) අධ්‍යාපනික තාක්ෂණ අධ්‍යක්ෂවරයා ;
(v) පුස්තකාලයාධිපතිවරයා ;
(vi) ලේඛකාධිකාරීවරයා ;
(vii) මූල්‍යාධිකාරීවරයා ;
(viii) අධ්‍යක්ෂ /මෙහෙයුම් ;
(ix) දත්ත සැකසුම් කළමනාකරු ;